# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2063/32 - 2018 මාර්තු මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2018.03.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය:* නුඑ/3/1/8/අත්පත්/143.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, සැන්ඩ්‍රිහැම් 476 ආර් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඩයගම බටහිර (1 වන කොටස) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක නු 3151 හා 2017.10.03 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 ලෙස පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4947 ක් පමණ වන ඉඩම් කොටස්වලට මායිම් :

01. **කැබලි අංක 01**

ඉඩමේ නම : ඩයගම බටහිර (1 වන කොටස) ; විස්තරය : තේ වගාව ; හිමිකම් කියන අය : සීමාසහිත ආගරපතන වැවිලි සමාගම, වොක්ස්හෝල් වීදිය, කොළඹ 02; ප්‍රමාණය: හෙක්. 4947.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 අප්‍රේල් මස 25 වැනි දින පෙ.ව. 10.30ට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 අප්‍රේල් මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එස්. පී. කේ. බෝධිමාන්න,<br>ප්‍රාදේශීය ලේකම්,<br>නුවරඑළිය.

2018 ක්වූ මාර්තු මස 19 වැනි දින,<br>නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-264

---

### ශුද්ධි පත්‍රිකාව

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි වගන්තිය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය :* BD/BD/LND/3/5/12.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්*




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*පත්‍රයේ* පළ කිරීමට, කැබලි අක්ෂර A, B සහ C ඉඩම් කොටස් ඇතුළත් කරන ලද බවද, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව අංක 1916/4 හා 2015.05.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ, 1A පිටුවේ සඳහන් මූලික පිඹුරු අංක බ. 673 ට අදාළ කැබලි අංක 3 (මූලික පිඹුරු අංක බ. 697 හි කැබලි අංක 3, 4, 5 හා 6 ) හා 4, නැවත මැනුම් කටයුතු සිදුකළ අතර, එම මැනුම් සංශෝධනය පරිදි මූලික පිඹුරු අංක බ. 673 හි කැබලි අංක 3 (මූලික පිඹුරු අංක බ. 697 හි කැබලි අංක 3, 4, 5 හා 6) D, E, F හා G වශයෙන්ද, කැබලි අංක 4 - H වශයෙන්ද, විභජනය වී ඇති අතර ඒ අනුව කැබලි අංක 3 (මූලික පිඹුරු අංක බ. 697 හා කැබලි අංක 3. 4, 5 හා 6) හා 4 ට අදාළ ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු බවද, මෙයින් ප්‍රකාශ කරමි.

**කැබලි අංක A**

ඉඩමේ නම : — ; වර්තමාන ඉඩම් පරිහරණය : කඳුර; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: රජය; මුල් හිමිකම් සහ වෙනත් කරුණු: මු.පි.බ. 673 හි කැබලි අංක 1 හි කොටසක්; ප්‍රමාණය : හෙක්. 0.0278.

**කැබලි අංක B**

ඉඩමේ නම : කුඩාබදුල්ලවක, වරිපනම් අංක 285, ග්‍රීන්ලේන් ඩ්‍රයිව්; වර්තමාන ඉඩම් පරිහරණය : වත්ත, අවුරුදු 20-30 පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: රජය; මුල් හිමිකම් සහ වෙනත් කරුණු: මු.පි.බ. 697 හි කැබලි අංක 1 හි කොටසක්, බදුලු ඔය දිගේ වෙන්කල බිම, බදුල්ල, වෙලගෙදර, ඉහළ අළුත් ඇළ පාර, අංක 20/3 හි පදිංචි දීප්ත ප්‍රසන්න ඒකනායක විසින් අනවසරයෙන් භුක්තිවිඳී; ප්‍රමාණය : හෙක්. 0.0363.

**කැබලි අංක C**

ඉඩමේ නම : කුඩාබදුල්ලවක, වරිපනම් අංක 285, ග්‍රීන්ලේන් ඩ්‍රයිව්; වර්තමාන ඉඩම් පරිහරණය : වත්ත, අවුරුදු 20-30 පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: රජය; මුල් හිමිකම් සහ වෙනත් කරුණු: මු.පි.බ. 697 හි කැබලි අංක 2 හි කොටසක්, බදුලු ඔය දිගේ වෙන්කල බිම, ලූණුවත්ත, කෝට්ටේගොඩ, දඹේවෙල හි පදිංචි ජමාල්ඩීන් මොහොමඩ් කාලිෆ් විසින් අනවසරයෙන් භුක්තිවිඳී; ප්‍රමාණය : හෙක්. 0.0363.

කැබලි අංක 3 විභජනය

**කැබලි අංක D**

ඉඩමේ නම : කුඩාබදුල්ලවක, වරිපනම් අංක 285, ග්‍රීන්ලේන් ඩ්‍රයිව්; වර්තමාන ඉඩම් පරිහරණය : වත්ත, අවුරුදු 20-30 පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: රජය; මුල් හිමිකම් සහ වෙනත් කරුණු: මු.පි.බ. 697 හි කැබලි අංක 3 හි කොටසක්, ලූණුවත්ත, කෝට්ටේගොඩ, දඹේවෙල හි පදිංචි ජමාල්ඩීන් මොහොමඩ් විසින් අනවසරයෙන් භුක්තිවිඳී, බදුල්ල් උසස් තාක්ෂණ ආයතනය සඳහා අවශ්‍ය වී ඇත; ප්‍රමාණය : හෙක්. 0.0153.

**කැබලි අංක E**

ඉඩමේ නම : කුඩාබදුල්ලවක, වරිපනම් අංක 285, ග්‍රීන්ලේන් ඩ්‍රයිව්; වර්තමාන ඉඩම් පරිහරණය : වත්ත, අවුරුදු 20-30 පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: රජය; මුල් හිමිකම් සහ වෙනත් කරුණු: මු.පි.බ. 697 හි කැබලි අංක 4 හි කොටසක්, වෙලගෙදර, ඉහළ අළුත් ඇළ පාර, අංක 20/3 හි පදිංචි දීප්ත ප්‍රසන්න ඒකනායක විසින් අනවසරයෙන් භුක්තිවිඳී, බදුල්ල් උසස් තාක්ෂණ ආයතනය සඳහා අවශ්‍ය වී ඇත; ප්‍රමාණය : හෙක්. 0.0616.

**කැබලි අංක F**

ඉඩමේ නම : කුඩාබදුල්ලවක, වරිපනම් අංක 285, ග්‍රීන්ලේන් ඩ්‍රයිව්; වර්තමාන ඉඩම් පරිහරණය : වත්ත, අවුරුදු 20-30 පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: දීප්ත ප්‍රසන්න ඒකනායක, අංක 20/3, ඉහළ අලුත් ඇළ පාර, වෙලගෙදර; මුල් හිමිකම් සහ වෙනත් කරුණු: මු.පි.බ. 697 හි කැබලි අංක 5 හි කොටසක් බදුල්ල උසස් තාක්ෂණ ආයතනය සඳහා අත්කර ගැනීමට මැන ඇත; ප්‍රමාණය : හෙක්. 0.1597.

**කැබලි අංක G**

ඉඩමේ නම : කුඩාබදුල්ලවක, වරිපනම් අංක 285, ග්‍රීන්ලේන් ඩ්‍රයිව්; වර්තමාන ඉඩම් පරිහරණය : වත්ත, අවුරුදු 20-30 පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: ජමාල්ඩීන් මොහොමඩ් තිලිෆ්, දඹේවෙල, කෝට්ටේගොඩ, ලූණුවත්ත; මුල් හිමිකම් සහ වෙනත් කරුණු: මු.පි.බ. 697 හි කැබලි අංක 6 හි කොටසක්, බදුල්ල උසස් තාක්ෂණ ආයතනය සඳහා අත්කර ගැනීමට මැන ඇත; ප්‍රමාණය : හෙක්. 0.0378.

කැබලි අංක 4 විභජනය

**කැබලි අංක H**

ඉඩමේ නම : කුඩාබදුල්ලවක කුඹුර, වරිපනම් අංක 281, ග්‍රීන්ලේන් ඩ්‍රයිව්; වර්තමාන ඉඩම් පරිහරණය : ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ අවුරුදු 20-30 පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: දීප්ත ප්‍රසන්න ඒකනායක, අංක 20/3, ඉහළ අළුත් ඇළ පාර. වෙලගෙදර; මුල් හිමිකම් සහ වෙනත් කරුණු: මු.පි.බ. 673 හි කැබලි අංක 4 හි කොටසක්, බදුල්ල් උසස් තාක්ෂණ ආයතනය සඳහා අත්කර ගැනීමට මැන ඇත; ප්‍රමාණය : හෙක්. 0.0145.

ඩබ්ලිව්. එම්. ආර්. රංජිත්,
ප්‍රාදේශීය ලේකම් *(වැ.බ.),*
බදුල්ල.

2018 ක්වූ මාර්තු මස 13 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-265

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.